සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 10 - 2023

# ඉතිහාසය - I

කාලය පැය 01 යි

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි :
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
- ප්‍රශ්න පත්‍රයේ දී ඇති අනෙකුත් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

---

01. මෙරට ශාසන ඉතිහාසය පිළිබඳ ලිය වී ඇති ග්‍රන්ථයක් වන්නේ මින් කුමක් ද?

(1) පූජාවලිය (2) බෝධි වංශය (3) දළදා සිරිත (4) නිකාය සංග්‍රහය

02. වංසත්ථප්පකාසිනී ග්‍රන්ථය හා නොගැළපෙන ප්‍රකාශය කුමක් ද?

(1) මෙම යුගයට අයත් වෙනත් සාහිත්‍ය මූලාශ්‍රයවලින් නො ලැබෙන තොරතුරු රැසක් මෙම ග්‍රන්ථයට ඇතුලත්ව තිබීම.

(2) මහා වංශයේ මුල් කොටස ලිය වී ශතවර්ෂ හතරකට පමණ පසු රචනාකොට ඇත.

(3) එම කෘතිය සංස්කෘත භාෂාවෙන් ලියා ඇත.

(4) මෙය ටීකා ග්‍රන්ථයක් ලෙස ද හඳුන්වනු ලබයි.

03. පොළොන්නරු යුගයේ දී භාවිත වූ කාසි විශේෂයකි,

(1) තඹ මස්ස (2) අක (3) පුරාණ (4) ධරණ

04. ශ්‍රී ලංකාවේ මුලින් ම ලියැ වී ඇති සෙල්ලිපි විශේෂය වන්නේ,

(1) ගිරි ලිපි ය. (2) පුවරු ලිපි ය. (3) ලෙන් ලිපි ය. (4) ටැම් ලිපි ය.

05. නැචුරලිස් හිස්ටෝරියා කෘතිය අයත් වන්නේ කුමක මූලාශ්‍ර වර්ගයකට ද?

(1) රෝම (2) ග්‍රීක (3) ඉංග්‍රීසි (4) ඕලන්ද

06. අතීතයේ පැවති ආගමික විශ්වාස පිළිබඳ තොරතුරු ලබාගැනීමේ දී වඩාත් වැදගත් වන්නේ මින් කුමන මූලාශ්‍රය වර්ගය ද?

(1) පුරාණ නටඹුන් (2) චිත්‍ර, මූර්ති හා කැටයම් (3) පුරාවස්තු (4) කාසි

07. මීට වසර 12 500 කට පෙර ලංකාවේ විසූ මානවයින්, කැලෑදෙල් ඇට පුළුස්සා ආහාරයට ගත් බවට සාක්ෂි හමු වී ඇති ස්ථානය වන්නේ,

(1) පාහියන්ගලය. (2) බෙල්ලන්බැඳිපැලැස්සය.

(3) කුරුවිටබටදොඹලෙනය. (4) කිතුල්ගලබෙලිලෙනය.

08. ඓතිහාසික යුගයේ පැරණි ග්‍රාමීය නිවාස පිළිබඳ පැහැදිලි සාධක හමු වී ඇති ප්‍රදේශ දෙක වන්නේ,

(1) අනුරාධපුරය හා මාගම ය.

(2) අනුරාධුපරය හා තිස්සමහාරාමයේ වළගම්පත්තුව ය.

(3) හල්දුම්මුල්ල හා බෙරගල ය.

(4) ඉබ්බන්කටුව හා වළගම්පත්තුව ය.



EXAMRESULTS.LK

09. පහත වගුවේ I තීරුවේ රජවරු කිහිපදෙනෙකුගේ නම් හා II තීරුවේ එම රජවරු සම්බන්ධ කරුණු කිහිපයක් දැක්වේ. I තීරුව අනුව II තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| (1) පණ්ඩුකාභය රජු | A - ඇළහැර ඇළ කරවීම. |
| (2) දේවානම්පිතිස්ස රජු | B - තානාපතිවරුන් රෝමයට යැවීම. |
| (3) වසභ රජු | C - ජයවැව ඉදිකර වීම. |
| | D - ඉසුරුමුණි විහාරය කරවීම. |

(1) ACD (2) BCD (3) CDA (4) DCB

10. ගම් නායකයන් අතර සාමය හා සහජීවනය පවත්වා ගැනීමට අත්‍යවශ්‍ය වූයේ කුමක් ද?

(1) ධනවත් හා බලවත් පුද්ගලයකු වීම. (2) එකිනෙකා සමග සුහදව කටයුතු කිරීම.
(3) පොදු විශ්වාසය දිනාගත් පුද්ගලයකු වීම. (4) පොහොසත් පුද්ගලයකු වීම.

- **පහත A සිට E දක්වා ප්‍රකාශ හොඳින් කියවා 11 සහ 12 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - එල්ලංගාව නිර්මාණය. B - පුද්ගලයන් කිහිප දෙනෙක් අතර බලය බෙදී පැවතීම.
C - විවිධ ආරවුල් විසඳීම. D - ප්‍රාදේශීය පාලනය
E - පොදු වැඩ කටයුතුවල දී නායකත්වය දැරීම.

11. පරුමකවරුන් සම්බන්ධ තොරතුරු පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) A හා D (2) B හා D (3) C හා B (4) D හා B

12. දසගම් ඇත්තන් සම්බන්ධ තොරතුරු පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) A හා C (2) B හා A (3) B හා E (4) C හා A

13. මධ්‍ය පාලනයේ දී රජුට සහය දැක්වූ නිලධාරීන් අතරින් වෙළඳ කටයුතු භාර නිලධාරියා සෙල්ලිපිවල හඳුන්වා ඇත්තේ කුමන නමකින් ද?

(1) කන පෙඩික (2) රූප අදෙක (3) පන අදෙක (4) බඩගරික

- ★ ලම්භකර්ණ වංශයට අයත් පාලකයෙකු වීම.
- ★ පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයකට සහභාගීවීම සඳහා ඉන්දියාවේ චේර රාජ්‍යයට යාම.

14. ඉහත සිදුවීම් හා සම්බන්ධ රජතුමා වන්නේ කවු ද?

(1) වසභ රජතුමා (2) ගජබාහු රජතුමා (3) භාතිකාභය රජතුමා (4) ඉලනාග රජතුමා

15. පහත I තීරුවේ කර්මාන්ත කීපයක් හා II තීරුවේ එම කර්මාන්ත පිළිබඳ තොරතුරු හමුවන සෙල්ලිපි කිහිපයක් දැක්වේ. I තීරුව අනුව II තීරුව නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| I තීරුව | II තීරුව |
|---|---|
| (1) තුලදර | A වෙහෙරකෙම |
| (2) කබර | B මුතුගල්ල |
| (3) තතවය | C මණ්ඩගල |

(1) BAC (2) BCA (3) CBA (4) CAB

16. අනුරාධපුරය නගරයක් ලෙස වර්ධනය වීමට තුඩුදුන් සාධක අතරින් ප්‍රධානතම සාධකය වූයේ,

(1) ස්වභාවික සම්පත් බහුලව පැවතීම යි. (2) දක්ෂ රජවරුන් පාලනය කිරීම යි.
(3) මල්වතු ඔය නිම්නයේ පිහිටා තිබීම යි. (4) අන්තර් ජාතික වෙළඳාම යි.

17. ශ්‍රී ලංකාවට දන්ත ධාතුන් වහන්සේ වැඩම කරවන ලද වරාය වන්නේ මින් කුමක් ද?

(1) ලංකාපටුන (2) මාතොට (3) දඹකොළපටුන (4) ගෝකණ්ණ

18. අතීතයේ දී නායක ස්වාමීන් වහන්සේලා යටතේ වැඩ වාසය කළ භික්ෂූන් වහන්සේලා හඳුන්වා ඇත්තේ,

(1) ථෙර නමිනි. (2) සද්ධිවිහරිය නමිනි.
(3) භාණකවරු නමිනි. (4) අන්තේවාසික නමිනි.

19. අතීතයේ දී ශ්‍රී ලංකාව ''සරන්ඩිබ්'' ලෙස හඳුන්වා ඇත්තේ පහත කුමන ජාතිකයන් විසින් ද?

(1) පෘතුගීසී (2) අරාබි (3) ලන්දේසි (4) ප්‍රංශ

20. රජරට ශිෂ්ටාචාර සමයට අයත් කෘති කිහිපයක් පහත වගුවෙහි I තීරුවේ දැක්වේ. II තීරුවේ එම කෘති රචනා කර ඇති භාෂාවන් දැක්වේ. I තීරුවට අනුව II තීරුව නිවැරදිව ගැළපූවිට ලැබෙන පිළිතුර තෝරන්න.

| I තීරුව | II තීරුව |
|---|---|
| (1) දීපවංශය | A සිංහල |
| (2) ජානකිහරණය | B පාලි |
| (3) සියබස්ලකර | C සංස්කෘත |

(1) ACB (2) BAC (3) BCA (4) CBA

21. අතීතයේ දී ඇළමාර්ග ඉදිකිරීම සම්බන්ධයෙන් කටයුතු කළ නිළධාරියා හඳුන්වා ඇත්තේ කෙසේ ද?

(1) රූපඅදෙක (2) කනපෙඩික (3) අඩික (4) නගරවුඩික

22. සීගිරි ජල උද්‍යානයේ කාණු පද්ධතිය දඟරාකාරව සකස් කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ,

(1) අලංකාරයක් ලබාගැනීම යි.

(2) ජලයේ ඇති රොන්මඩ ස්වභාවික ගුරුත්ව බලයෙන් පහළට කිඳා බැසීමට සැලැස්වීම යි.

(3) ජලමල් ක්‍රියාකාරීත්වයට ඉඩ සැලසීම යි.

(4) භූ විෂමතාව අනුව සැකසීම යි.

23. අතීතයේ දී ස්වභාව ධර්මයට අයත් භෞතික තත්ත්ව මැන ගැනීමට භාවිත කළ මිනුම් අතරින් අවකාශය හා බර මැනීම සඳහා භාවිත කළ මිනුම් පිළිවෙළින් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) කුරුණි, අක (2) පෑල, ලික්බ (3) ගුන්ජා, හවජර (4) ධරණ, අමුණු

24. දැදිගම සූතිඝර දාගැබෙහි ධාතු ගර්භයේ තිබී සොයාගන්නා ලද ඇත් පහන සාදා ඇති ලෝහ වර්ගය වන්නේ,

(1) ලෝකඩ ය. (2) රිදී ය. (3) තඹ ය. (4) යකඩ ය.

25. අතීත සමාජ සංවිධානය තුළ ගොඩනැගුණු ධූරාවලියට අනුව සෙල්ලිපිවල ''කුඩීන්'' නමින් හඳුන්වා ඇති ජන කණ්ඩායම කුමක් ද?

(1) ප්‍රභූන් (2) දාසයන් (3) ධනවතුන් (4) සාමාන්‍ය ජනතාව

26. නිසි කලට සී සෑම නොකරන පුද්ගලයින්ට කළං පහක දඩයක් නියම කිරීම සම්බන්ධ නීතියක් සඳහන් කර ඇති මූලාශ්‍රය වන්නේ,

(1) සොරබොර වැව ටැම් ලිපිය යි. (2) මිහින්තලා පුවරු ලිපිය යි.

(3) වේවැල්කැටිය සෙල්ලිපිය යි. (4) කොණ්ඩවට්ටවාන් ටැම් ලිපිය යි.

27. අතීතයේ දී භාවිතයට ගන්නා ලද කැඳ වර්ග අතරින් සහල් කොටසකට වතුර කොටස් හයක් යොදා රෝගීන් වෙනුවෙන් සාදන කැඳ වර්ගය හැඳින්වූයේ කුමන නමකින් ද?

(1) යවාගු (2) ඇඹුල්හඹු (3) දියකැඳ (4) රසඋළුකැඳ

28. අතීත ජන සමාජයේ නායකත්වය හිමිකර ගැනීමට බලපා ඇති ප්‍රධානතම සාධකයක් වී ඇත්තේ,

(1) මනා පෞරුෂයක් හිමි පුද්ගලයකු වීම යි.

(2) බොහෝ දෙනෙකුගේ සිත් දිනාගත් පුද්ගලයකු වීම යි.

(3) ආර්ථික වශයෙන් සමෘද්ධිමත් පුද්ගලයකු වීම යි.

(4) රූසිරි යොවුන් ගුණයෙන් යුක්ත වීම යි.

29. මහනුවර යුගයේ පාලකයින් ශ්‍රී ලංකාවේ උපසම්පදාව නැවත පිහිටුවා ගැනීම සඳහා ආධාර ලබා ගත් අග්නිදිග ආසියානු රටවල් දෙක ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ඉන්දියාව හා බුරුමය (2) බුරුමය හා කාම්බෝජය

(3) කාම්බෝජය හා ඉන්දියාව (4) බුරුමය හා සියම

30. කාලිංග මාඝ ආක්‍රමණයෙන් පසු ලංකාවේ විවිධ ප්‍රදේශවල ස්වාධීන පාලන මධ්‍යස්ථාන පිහිටුවාගත් පුද්ගලයින් I තීරුවේ ද, එසේ පිහිටුවා ගන්නා ලද පාලන මධ්‍යස්ථාන II තීරුවේ ද දැක්වේ. I තීරුවට අනුව II තීරුව නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

| I තීරුව | II තීරුව |
|---|---|
| (1) සුභ සෙන්පති | A මිණිපේ ගංදෙනිය |
| (2) බුවනෙකබා ආදිපාද | B දඹදෙණිය |
| (3) සංඛ සෙනෙවි | C සුභ පබ්බත |
| (4) වන්නි විජයබාහු | D ගෝවින්දමලය |

(1) BACD (2) BCDA (3) CDAB (4) DCBA

31. පහත පාලකයන් අතරින් යාපහුව රාජධානියේ ආරම්භක පාලකයා වන්නේ කවු ද?

(1) පණ්ඩුකාභය රජු (2) I බුවනෙකබාහු රජු (3) I විජයබාහු රජු (4) III විජයබාහු රජු

32. හේන් වගාව පැරණි සෙල්ලිපිවල හඳුන්වා ඇත්තේ කුමන නමකින් ද?

(1) සේන් (2) සෙහෙන් (3) නවදැලිහේන් (4) පිටිබිම්

33. පහත විදේශිකයන් අතරින් මහාවිහාරයේ අධ්‍යාපන කටයුතු කළ විදේශික භික්ෂූන් වහන්සේ වන්නේ කවු ද?

(1) එස්. මහින්ද හිමි (2) බුද්ධඝෝෂ හිමි (3) පාහියන් හිමි (4) හියුං සෑං හිමි

- **පහත සඳහන් A හා B ප්‍රකාශ ඇසුරෙන් 34 හා 35 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - උපසග්ගරෝගනාස නම් රෝහල් ඉදි කිරීම.

B - ගැබිණි මව්වරුන් සඳහා විශේෂිත රෝහල් පිහිටු වීම.

34. අතීත රජවරුන් ජනතාවගේ සුභසාධනය සඳහා ගත් ක්‍රියාමාර්ග ලෙස,

(1) A හා B දෙකම සත්‍ය වේ. (2) A සත්‍යයි, B අසත්‍යයි.

(3) B සත්‍යයි, A අසත්‍යයි. (4) A හා B දෙකම අසත්‍යයි.

35. පළමුවන උපතිස්ස රජු විසින් ගත් ක්‍රියාමාර්ගයක් ලෙස,

(1) A සත්‍යයි, B අසත්‍යයි. (2) B සත්‍යයි, A අසත්‍යයි.

(3) A හා B දෙකම සත්‍යයි. (4) A හා B දෙකම අසත්‍යයි.

- **පහත A, B, C හා D යටතේ ප්‍රකාශ යුගලය බැගින් දක්වා ඇත. මෙහි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවය පරීක්ෂා කර 36 - 39 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - 1. සමාජ ස්තරායනය
2. නිෂ්පාදන අතිරික්තය

B - 1. පූර්ව ඓතිහාසික යුගය
2. පීඩන ශල්කනය

C - 1. නීති රීති
2 සමාජයේ යහපැවැත්ම

D - 1. රාජ්‍යත්වයේ වර්ධනය
2. බලය විමධ්‍යගත වීම.

36. පළමුවැන්න මගින් දෙවැන්න සිදුවන බව දැක්වෙන යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

37. දෙවැන්න නිසා පළමු වැන්න සිදු වී ඇති බව දැක්වෙන පද යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

38. පළමුවැන්න හා දෙවැන්න අතර කිසිදු සම්බන්ධතාවයක් නො දක්වන පද යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

39. එකිනෙකට විරුද්ධ මතයන් ඉදිරිපත්වන පද යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

40. ශ්‍රී ලංකාවේ සිදුකරන ලද කැණීම්වල දී හමුවන විදේශීය කාසි අතරින් සුලබව හමු වූ කාසි විශේෂය වන්නේ,

(1) ඉන්දියානු කාසි ය. (2) රෝම කාසි ය. (3) චීන කාසි ය. (4) ග්‍රීක කාසි ය.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2023**
**Second Term Test - Grade 10 - 2023**

# ඉතිහාසය - II

කාලය පැය 03 යි

අමතර කියවීම් කාලය මිනිත්තු 10

නම/ විභාග අංකයඃ

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

සැලකිය යුතුයි

- **I** කොටසේ ප්‍රශ්න අංක 01 අනිවාර්ය වේ.
- **II** කොටසින් ප්‍රශ්න 5 ක් ද, තෝරාගෙන පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

---

### I - කොටස

(01) (අ) (i) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලංකා සිතියමේ ලකුණු කර නම් කරන්න.

පරාක්‍රමසමුද්‍රය, මල්වතු ඔය, කිරිඳි ඔය, නාච්චදූව වැව, පොම්පරිප්පු, මිනිහාගල්කන්ද, සීගිරිය, අලිමංකඩ, කතරගම, නල්ලූර්, ඇලහැර අමුණ, කෝට්ටේ (ලකුණු 12)

(ii) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.

බුරුමය, රතු මුහුද , ඉතාලිය, මදුරාසිය, සුමාත්‍රා දූපත, ලිස්බන් (ලකුණු 06)

(ආ) (i) පහත A, B, C, D යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු පිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

A - දසගම් ඇත්තන් පිළිබඳව තොරතුරු සඳහන් සෙල්ලිපිය.

B - ශ්‍රී ලංකාවේ දේශපාලන බලය මධ්‍යගත වීමෙන් පසු ගොඩනැගුණු පරිපාලන සැලැස්මේ රාජ්‍ය ලේඛනාගාරයේ ප්‍රධාන නිලධාරියා සෙල්ලිපිවල හඳුන්වා ඇති නම.

C - වෙළඳාම පිළිබඳ නීතිරීති ඇතුළත් බදුලු ටැම් ලිපිය කරවූ රජතුමා

D - සබරගමු පළාතේ වැසියන් ගවයින්ගේ ආරක්ෂාව සඳහා සිදුකරන ලද ශාන්ති කර්මය හැඳින්වූ නම (ලකුණු 04)

- A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

A



(ii) 1. A රූපයෙන් දැක්වෙන නිර්මාණය හමු වී ඇති ස්ථානය කුමක් ද?

2. එම නිර්මාණය කුමන යුගයකට අයත් වූවක් ද?

3. මෙම බඳුන අලංකාර කිරීමට අවශ්‍ය වර්ණ සකස්කර ගැනීම සඳහා යොදාගත් ප්‍රධාන අමුද්‍රව්‍ය කුමක් ද?

4. මෙම යුගයටම අයත් මෙවැනි බඳුනක් හමු වූ වෙනත් ස්ථානයක් නම් කරන්න. (ලකුණු 04)

(iii) 1. B පින්තූරයෙන් දැක්වෙන කාසි විශේෂය නම් කරන්න.

2. ඒවා කිනම් රටක නිෂ්පාදනය කරන ලද ඒවා ද?

3. එම කාසි වර්ගය ලංකාවට ගෙන එන ලද්දේ කවුරුන් විසින් ද?

4. මෙම කාසි විශේෂය සාහිත්‍ය මූලාශ්‍රයවල හඳුන්වා ඇති නම ලියන්න. (ලකුණු 04)

B



---

## II කොටස

02. (i) අතීතයේ දී අභිලේඛන රචනා කිරීම සඳහා යොදා ගනු ලැබූ මාධ්‍ය **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) ශ්‍රී ලංකාවේ පැරණි ප්‍රාදේශීය මායිම් පෙන්වන සලකුණු **හතරක්** ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) ලංකා ඉතිහාසය හැදෑරීමේ දී සාහිත්‍ය මූලාශ්‍රයවලින් ඇති ප්‍රයෝජන **දෙකක්** දක්වා ඒ පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) ඉතිහාසය ඉගෙනීමෙන් ලද හැකි ප්‍රයෝජන **තුනක්** නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

03. (i) පුරාවිද්‍යාත්මක කැණීම් සිදුකරන ලද, ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගල් යුගයට අයත් ස්ථාන **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) ප්‍රාග් ඓතිහාසික ගල් යුගයේ මානවයින්,

- ★ ආහාර ලබාගැනීමේ පහසුව
- ★ ශිලා මෙවලම් තනා ගැනීමට අවශ්‍ය පාෂාණ ලබාගැනීමට ඇති පහසුව

වැනි සාධක මත ජීවත්වීමට වැඩි රුචිකත්වයක් දැක් වූ ප්‍රදේශ **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

(iii) ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයාගේ ජීවන රටාවේ කැපීපෙනෙන ලක්ෂණ දෙකක් දක්වා ඒ පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) ගල් යුගයේ පැවති අභිචාර විධි සම්බන්ධ තොරතුරු හමු වූ ස්ථාන **තුනක්** දක්වා ඒවායෙහි දක්නට ලැබෙන අභිචාර විධි පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

04. (i) පූර්ව ඓතිහාසික යුගයට අයත් ශිලා මංජුසා සොහොන් හමු වී ඇති ස්ථාන 03 ක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත A සිට D දක්වා දී ඇති එක් එක් ප්‍රකාශයට අදාළ පිළිතුර වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - බ්‍රාහ්මීය සෙල්ලිපිවල පවුලක ප්‍රධානියා හඳුන්වා ඇති නම.

B - කිරිඳි ඔය හරස් කොට අමුණක් බැඳීමට කටයුතු කළ රජු

C - අනුරාධපුරය හැඳින්වීමට ''නුරුපුර'' යන ව්‍යවහාරය යෙදී ඇති අභිලේඛනය.

D - අයිස් යුගය නිමාවට පත්වීමත් සමග සමස්ත දකුණු ආසියානු කලාපයම උණුසුම් වී එහි කෘෂිකර්මාන්තයට උචිත පරිසරයක් නිර්මාණය වූ යුගය හැඳින්වෙන නම

(පනාකඩුව තඹ සන්නස, හොලෝසීන යුගය, ප්ලයිස්ටෝසීන යුගය, වල්ලිපුරම් රන් සන්නස, ඉලනාග රජු, ගහපති, අභයනාග රජු, ගෘහපති) (ලකුණු 04)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ, තාක්ෂණයේ දියුණුව පිළිබිඹු වන අවස්ථා දෙකක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ව්‍යුහය හා ස්වරූපයේ දැකිය හැකි ලක්ෂණ **තුනක්** පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

05. (i) ශ්‍රී ලංකාව එක්සත් කිරීමේ කටයුතුවල දී දුටුගැමුණු රජතුමාට සහය දැක් වූ පරුමකවරුන් **තිදෙනෙක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) A සිට D දක්වා ඉදිරිපත් කර ඇති රාජ්‍යත්ව සංකල්පය හා සම්බන්ධ රජවරුන් A, B, C හා D පිළිවෙළින් ලියා දක්වන්න.

A - අලකපය මහරජ

B - නරේශ්වර

C - චක්‍රවර්ති ස්වාමීන් වහන්සේ

D - මින්නේරි දෙවියන් (ලකුණු 04)

(iii) අතීත ශ්‍රී ලංකාවේ රජ්‍ය උරුමය සිදු වූ ප්‍රධාන ආකාර **දෙක** උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(iv) I විජයබාහු රාජ්‍ය සමයේ වැදගත්කම කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

06. (i) පහත සඳහන් A, B හා C යෙදුම්වලින් අදහස් වන්නේ කුමක් දැයි පිළිවෙළින් ලියා දක්වන්න.

A - එක් තැන් සමිය

B - සභාව

C - වොහාර (ලකුණු 03)

(ii) පහත A හා B වලින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - පණ්ඩුකාභය රාජ්‍ය සමයේ ඉදිකරවන ලද ආගමික ගොඩනැගිලි දෙකක් නම් කරන්න.

B - 1. මාතොට වරාය හා

2. ත්‍රිකුණාමලය වරාය

ආශ්‍රිතව පිහිටි කෝවිල බැගින් නම් කරන්න. (ලකුණු 04)

(iii) අතීත ශ්‍රී ලාංකිකයන් වාර්ගික සහජීවනයෙන් යුක්තව ජීවත් වූ බව උදාහරණ **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) අතීත ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර වෙළඳාම ක්‍රමවත් අයුරින් සිදු වූ බව උදාහරණ **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

07. (i) අතීතයේ විසූ ජනයා දිග දුර මැනීම සඳහා යොදා ගන්නා ලද මිනුම් **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) අතීතයේ දී මහවැව් තැනීම මගින් අපේක්ෂා කළ අරමුණු **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

(iii) පුරාණයේ යකඩ නිස්සාරණය කළ බවට සාධක ලැබෙන ස්ථාන **දෙකක්** දක්වා එහි යකඩ නිස්සාරණය කළ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) අතීතයේ ජල කළමනාකරණය සඳහා තාක්ෂණය යොදාගත් ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 )

08. (i) අතීත ශ්‍රී ලංකාවේ ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ පෙන්නුම් කරන බෞද්ධාගමික ගොඩනැගිලි වර්ග **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) අපේ පැරැන්නන් කෙම්පහන් ක්‍රම අනුගමනය කිරීමෙන් ඉටුකර ගැනීමට අපේක්ෂා කළ අරමුණු **දෙකක්** ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) අතීත පාලකයන් ජනතාවගේ සනීපාරක්ෂාව හා ස්වස්ථතාව ආරක්ෂා කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග **දෙකක්** උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) රුවන්වැලිසෑයේ ඉදිකිරීම් හා සීගිරි උද්‍යානයේ නගර නිර්මාණය ඇසුරෙන් අතීත ශ්‍රී ලංකාවේ ගෘහ නිර්මාණ ශිල්පය උසස් තාක්ෂණයකින් යුක්ත වූ බව පැහැදිලි කරන්න. (ලකුණු 06)

09. (i) අතීත ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ බදු නීතිය යටතේ කෘෂිකාර්මික කටයුතුවල දී රජය විසින් අයකළ බදු වර්ග **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) පරිසරය ආරක්ෂා කරගැනීම සඳහා නීති පැනවූ පාලකයන් **දෙදෙනෙකු** නම් කර ඊට ඉදිරියෙන් ඔවුන් විසින් ඒ සඳහා පනවන ලද නීතිය බැගින් ලියා දක්වන්න. (ලකුණු 04)


(iii) අතීත ජන සමාජය තුළ කාන්තාවට ගෞරවනීය ස්ථානයක් හිමි ව තිබූ බව උදාහරණ **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) පොළොන්නරුව රාජධානිය බිඳ වැටීමට බලපෑ හේතු තුනක් දක්වා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(01) (අ) (i)
(01) (*a*) (i)
(01) (அ) (i)



(01) (අ) (ii)
(01) (*a*) (ii)
(01) (அ) (ii)



## පිළිතුරු පත්‍රය - I කොටස


| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(4) | 2 -(3) | 3 -(1) | 4 -(3) | 5 -(1) | 6 -(2) | 7 -(4) | 8 -(2) | 9 -(3) | 10 -(2) |
| 11-(1) | 12-(3) | 13-(3) | 14-(1) | 15-(3) | 16-(4) | 17-(1) | 18-(4) | 19-(2) | 20-(3) |
| 21-(3) | 22-(2) | 23-(2) | 24-(1) | 25-(4) | 26-(4) | 27-(1) | 28-(1) | 29-(4) | 30-(3) |
| 31-(2) | 32-(4) | 33-(2) | 34-(1) | 35-(2) | 36-(3) | 37-(1) | 38-(2) | 39-(4) | 40-(2) |


(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II පත්‍රය - I කොටස

(01) (අ) (i) ලංකා සිතියමේ නිවැරදිව ලකුණු කර නම් කර ඇති ස්ථානවලට ලකුණු පිරිනමන්න.

(ii) ලෝක සිතියමේ නිවැරදිව ලකුණු කර නම් කර ඇති ස්ථානවලට ලකුණු පිරිනමන්න.




(ආ) (i) A- කළුදිය පොකුණ සෙල්ලිපිය B - කනපෙඩික

C - IV උදය රජු D - කිරිමඩුයාගය

(ii) (1) උඩරංචාමඩ නිවාසය (2) පූර්ව ඓතිහාසික යුගය

(3) ගුරුගල් (4) හල්දුම්මුල්ල

(iii) (1) හස් එබූ කාසි (2) ඉන්දියාව

(3) උතුරු ඉන්දීය වෙළඳුන් විසින් (4) කහවණු

II කොටස

02. (i) ගල්, රන්, තඹ, මැටි, ලී, බිත්ති

(ii) ඉර හඳ රූප, වටා පොත, දුන්න ඊතලය හක්ගෙඩිය, ගොන්කුරය, ඇත් අඩිය හා විවිධ සත්ව රූප

(iii) ★ ඓතිහාසික කාල අනුපිළිවෙල සකස් කර ගැනීමට.
★ එක් මූලාශ්‍රයක් මගින් ලැබෙන තොරතුරු තවත් මූලාශ්‍රයක් මගින් සනාථ කර ගැනීමට.
★ එක් එක් අවධිවල දේශපාලන, ආර්ථික සමාජ සංස්කෘතික කටයුතු පිළිබඳ තොරතුරු ලබාගැනීමට.
★ රටක විදේශ සබඳතා අධ්‍යයනය කිරීමට.

(iv) ★ පෞරුෂ වර්ධනයට
★ තමා ජීවත්වන සමාජය හා ලෝකය පිළිබඳ යථාවබෝධය.
★ අතීත අත්දැකීම් මගින් වර්තමානය තේරුම් ගෙන අනාගතය ගොඩනැගීම.
★ රටේ ජාතික අනන්‍යතාව හඳුනාගැනීම.
★ අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීමට පුරුදු වීම.
★ විවිධ මත ඉවසීමට පුරුදු වීම.

03. (i) බුන්දල, මිනිහාගල්කන්ද, උඩමලල, අලුගල්ගේ

(ii) ★ වියළි කලාපීය වනාන්තර
★ මුහුදු බඩ කලපු හා විල්ලු ආශ්‍රිත ප්‍රදේශය
★ පහතරට වැසි වනාන්තර ප්‍රදේශ
★ කඳුකර තණබිම්

(iii) ★ ආහාර අවශ්‍යතා සපුරා ගැනීමට සංචාරක ජීවිතයක් ගත කිරීම.
★ කුඩා කණ්ඩායම් වශයෙන් සංවිධානය වීම.

(iv) <u>රාවණා ඇල්ල ලෙන</u>
දෙකට බෙදෙන සේ සිදුරු විදින ලද මිනිස් හිස්කබලක් හමුවීම. එමෙන් ම හිස් කබලේ පිටතට නෙරා ඇති කොටස් ගලක උරච්චි කොට ඒ මත ගුරුගල් ආලේප කිරීම.
<u>පාහියන්ගල ලෙන</u>
මළසිරුර එහි කොටස් දිරායන තුරු යම් තැනක වළලා දමා පසුව ඇටසැකිලි ගුරුගල් ආලේප කොට නැවත ඒවා තැන්පත් කිරීම.
කුරුවිට ඉටදොඹ ලෙන
ඇටසැකිල්ල වකුටු කර වළලා තිබීම.

04. (i) ඉබ්බන්කටුව, ගල්සොහොන්කනත්ත, යටිගල්පොත්ත

(ii) A - ගහපති B - ඉලනාග රජු C - පනාකඩුව තඹ සන්නස
D - හොලෝසීන යුගය

(iii) ★ මැටි ඔරු සුසාන ★ නිවාස ඉදි කිරීම.
★ මැටි වළං ★ යකඩ මෙවලම් තැනීම
(සවිස්තර තොරතුරු පෙළපොත 63 - 65)

(iv) ★ වෘත්තීන් අනුව හා කාර්යන් අනුව ගම් බිහිවීම.
★ ගම්වල පරිපාලනය සංවිධානාත්මකව සිදුවීම.
★ ස්වභාවික සම්පත් වල ව්‍යාප්තිය හා සුලභතාව මත ගම්වල ප්‍රමාණය තීරණය කිරීම.

05. (i) වේළුසුමන, පුස්සදේව, ථේරපුත්තාභය, නන්දිමිත්‍ර

(ii) A - I කාශ්‍යප රජු B - කුටකණ්ණාභය රජු
C - කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජු D - මහසෙන් රජු

(iii) ★ <u>පියාගෙන් පුතාට</u>
උදා - පණ්ඩුකාභය - මුටසිව - දේවානම්පියතිස්ස
කාවන්තිස්ස - දුටුගැමුණු
වසභ - වංකනාසිකතිස්ස
★ සහෝදරයාගෙන් සහෝදරයාට
උදා - දේවානම්පියතිස්ස රජුගෙන් පසු උත්තිය, සූරසේන, අසේල
දුටුගැමුණු රජුගෙන් පසු - සද්ධාතිස්ස

(iv) ★ චෝල පාලනයෙන් රජරට මුදවා ගැනීම.
★ කාලී අවශ්‍යතාව මත පොළොන්නරුව රාජ්‍ය පාලන මධ්‍යස්ථානය කොට ගැනීම.
★ නැවත විදේශ ආක්‍රමණ එල්ල වීම වැළැක්වීමට උපක්‍රමශීලීව කටයුතු කිරීම.

06. (i) A - රාජ සභාව B - අධිකරණය C - නීති විශාරදයෝ
(ii) A සිවිකාශාලා / සොත්ථිශාලා
B තිරුකේතිශ්වරම් / කෝණේශ්වරම්
(iii) ★ රජවරුන් වාර්ගික සහජීවනයට ක්‍රියාකළ ආකාරය
★ සාමාන්‍ය ජනයා ද්‍රවිඩ හා මුස්ලිම් ජන කණ්ඩායම් සමග සහජීවනයේ කටයුතු කළ ආකාරය.
(iv) ★ වෙළඳපලවල් හා වෙළඳසැල් පැවතීම.
★ අභ්‍යන්තර වෙළඳාමේ දී නීති රීති පනවමින් අකටයුතුකම් පාලනය.
★ වෙළඳ ශ්‍රේණි වශයෙන් සංවිධානාත්මක වෙළඳාම සිදු කිරීම.

07. (i) ගව්ව, යොදුන, උසබ
(ii) ★ කෘෂිකාර්මික කටයුතු සාර්ථක කර ගැනීමට.
★ ගංවතුර පාලනය කිරීම.
★ නාගරික ජනතාවගේ වෙනත් අවශ්‍යතා සම්පූර්ණ කිරීම.
(iii) බලංගොඩ සමනල වැව - ස්වභාවික සුළං බලය යොදා ගනිමින්.
දෙහි ඇළකන්ද ප්‍රදේශය - මයිනහම ආධාරයෙන් සුළං බලය ලබාගනී.
(iv) ★ වැව්බැම්ම ඉදිකිරීම පිළිබඳ.
★ සොරොව්ව හා බිසෝකොටුව ඇසුරෙන්
★ රළපනාව

08. (i) දාගැබ්, බෝධිඝර, පිළිමගෙවල් විහාරගෙවල්, ආරාම, දානශාලා
(ii) ★ වගාවලට වැළඳෙන කෘමි උවදු වළක්වා ගැනීම.
★ හරකුන්ට වැළඳෙන ඇතැම් රෝග නිවාරණයට
(iii) ★ රෝහල් ඉදි කිරීම.
★ වැසිකිළි කැසිකිළිවල අපද්‍රව්‍ය කළමණාකරනයට කටයුතු කිරීම.
(iv) පෙළපොතෙහි පිටු අංක 68, 69, 70

09. (i) භෝජකපති, දකපති, මතරමජිබක, නෙටුකනබ අය, කැති අඩ
(ii) ★ කැලෑවල ගස් කොළන් නොකැපිය යුතුය. - III උදය
★ උස් ගොඩබිම් කළමනාකරණයේ දී රජය විසින් පනවා තිබෙන නීති රීතිවලට අනුකූලව ක්‍රියා කළ යුතුයි. - V කාශ්‍යප රජු
★ නිසි කලට සී සෑම නොකරන පුද්ගලයන්ට දඩ නියම කිරීම. - V කාශ්‍යප රජු
(iii) ★ කාන්තාවට පාලනය සම්බන්ධ වීමට අවස්ථාව ලැබීම.
★ මවක් වීම නිසා ගෞරවයට පාත්‍ර වීම.
★ එදිනෙදා කටයුතු කිරීම වෙනුවෙන් ගෞරවය පුද කිරීම ආදී.
(iv) ★ රජ පෙළපත් අතර බල අරගල
★ දුර්වල පාලකයන් බලයට පත්වීම.
★ ආර්ථික පරිහානිය
★ කාලිංග මාඝ ආක්‍රමණය

## පිළිතුරු පත්‍රය - I කොටස


| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(4) | 2 -(3) | 3 -(1) | 4 -(3) | 5 -(1) | 6 -(2) | 7 -(4) | 8 -(2) | 9 -(3) | 10 -(2) |
| 11 -(1) | 12 -(3) | 13 -(3) | 14 -(1) | 15 -(3) | 16 -(4) | 17 -(1) | 18 -(4) | 19 -(2) | 20 -(3) |
| 21 -(3) | 22 -(2) | 23 -(2) | 24 -(1) | 25 -(4) | 26 -(4) | 27 -(1) | 28 -(1) | 29 -(4) | 30 -(3) |
| 31 -(2) | 32 -(4) | 33 -(2) | 34 -(1) | 35 -(2) | 36 -(3) | 37 -(1) | 38 -(2) | 39 -(4) | 40 -(2) |


(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II පත්‍රය - I කොටස

(01) (අ) (i) ලංකා සිතියමේ නිවැරදිව ලකුණු කර නම් කර ඇති ස්ථානවලට ලකුණු පිරිනමන්න.

(ii) ලෝක සිතියමේ නිවැරදිව ලකුණු කර නම් කර ඇති ස්ථානවලට ලකුණු පිරිනමන්න.




(ආ) (i) A- කළුදිය පොකුණ සෙල්ලිපිය B - කනපෙඩික

C - IV උදය රජු D - කිරිමඩුයාගය

(ii) (1) උඩරංචාමඩ නිවාසය (2) පූර්ව ඓතිහාසික යුගය

(3) ගුරුගල් (4) හල්දුම්මුල්ල

(iii) (1) හස් එබූ කාසි (2) ඉන්දියාව

(3) උතුරු ඉන්දීය වෙළඳුන් විසින් (4) කහවණු

II කොටස

02. (i) ගල්, රන්, තඹ, මැටි, ලී, බිත්ති

(ii) ඉර හඳ රූප, වටා පොත, දුන්න ඊතලය හක්ගෙඩිය, ගොන්කුරය, ඇත් අඩිය හා විවිධ සත්ව රූප

(iii) ★ ඓතිහාසික කාල අනුපිළිවෙල සකස් කර ගැනීමට.
★ එක් මූලාශ්‍රයක් මගින් ලැබෙන තොරතුරු තවත් මූලාශ්‍රයක් මගින් සනාථ කර ගැනීමට.
★ එක් එක් අවධිවල දේශපාලන, ආර්ථික සමාජ සංස්කෘතික කටයුතු පිළිබඳ තොරතුරු ලබාගැනීමට.
★ රටක විදේශ සබඳතා අධ්‍යයනය කිරීමට.

(iv) ★ පෞරුෂ වර්ධනයට
★ තමා ජීවත්වන සමාජය හා ලෝකය පිළිබඳ යථාවබෝධය.
★ අතීත අත්දැකීම් මගින් වර්තමානය තේරුම් ගෙන අනාගතය ගොඩනැගීම.
★ රටේ ජාතික අනන්‍යතාව හඳුනාගැනීම.
★ අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීමට පුරුදු වීම.
★ විවිධ මත ඉවසීමට පුරුදු වීම.

03. (i) බුන්දල, මිනිහාගල්කන්ද, උඩමලල, අලුගල්ගේ

(ii) ★ වියළි කලාපීය වනාන්තර
★ මුහුදු බඩ කලපු හා විල්ලු ආශ්‍රිත ප්‍රදේශය
★ පහතරට වැසි වනාන්තර ප්‍රදේශ
★ කඳුකර තණබිම්

(iii) ★ ආහාර අවශ්‍යතා සපුරා ගැනීමට සංචාරක ජීවිතයක් ගත කිරීම.
★ කුඩා කණ්ඩායම් වශයෙන් සංවිධානය වීම.

(iv) <u>රාවණා ඇල්ල ලෙන</u>
දෙකට බෙදෙන සේ සිදුරු විදින ලද මිනිස් හිස්කබලක් හමුවීම. එමෙන් ම හිස් කබලේ පිටතට නෙරා ඇති කොටස් ගලක උරච්චි කොට ඒ මත ගුරුගල් ආලේප කිරීම.
<u>පාහියන්ගල ලෙන</u>
මළසිරුර එහි කොටස් දිරායන තුරු යම් තැනක වළලා දමා පසුව ඇටසැකිලි ගුරුගල් ආලේප කොට නැවත ඒවා තැන්පත් කිරීම.
කුරුවිට ඉටදොඹ ලෙන
ඇටසැකිල්ල වකුටු කර වළලා තිබීම.

04. (i) ඉබ්බන්කටුව, ගල්සොහොන්කනත්ත, යටිගල්පොත්ත

(ii) A - ගහපති B - ඉලනාග රජු C - පනාකඩුව තඹ සන්නස
D - හොලෝසීන යුගය

(iii) ★ මැටි ඔරු සුසාන ★ නිවාස ඉදි කිරීම.
★ මැටි වළං ★ යකඩ මෙවලම් තැනීම
(සවිස්තර තොරතුරු පෙළපොත 63 - 65)

(iv) ★ වෘත්තීන් අනුව හා කාර්යන් අනුව ගම් බිහිවීම.
★ ගම්වල පරිපාලනය සංවිධානාත්මකව සිදුවීම.
★ ස්වභාවික සම්පත් වල ව්‍යාප්තිය හා සුලභතාව මත ගම්වල ප්‍රමාණය තීරණය කිරීම.

05. (i) වේළුසුමන, පුස්සදේව, ථේරපුත්තාභය, නන්දිමිත්‍ර

(ii) A - I කාශ්‍යප රජු B - කූටකණ්ණාභය රජු
C - කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජු D - මහසෙන් රජු

(iii) ★ <u>පියාගෙන් පුතාට</u>
උදා - පණ්ඩුකාභය - මුටසිව - දේවානම්පියතිස්ස
කාවන්තිස්ස - දුටුගැමුණු
වසභ - වංකනාසිකතිස්ස
★ සහෝදරයාගෙන් සහෝදරයාට
උදා - දේවානම්පියතිස්ස රජුගෙන් පසු උත්තිය, සූරසේන, අසේල
දුටුගැමුණු රජුගෙන් පසු - සද්ධාතිස්ස

(iv) ⋆ චෝල පාලනයෙන් රජරට මුදවා ගැනීම.
⋆ කාලී අවශ්‍යතාව මත පොළොන්නරුව රාජ්‍ය පාලන මධ්‍යස්ථානය කොට ගැනීම.
⋆ නැවත විදේශ ආක්‍රමණ එල්ල වීම වැලැක්වීමට උපක්‍රමශීලීව කටයුතු කිරීම.

06. (i) A - රාජ සභාව B - අධිකරණය C - නීති විශාරදයෝ
(ii) A සිවිකාශාලා / සොත්ථිශාලා
B තිරුකේතිශ්වරම් / කෝනේශ්වරම්
(iii) ⋆ රජවරුන් වාර්ගික සහජීවනයට ක්‍රියාකළ ආකාරය
⋆ සාමාන්‍ය ජනයා ද්‍රවිඩ හා මුස්ලිම් ජන කණ්ඩායම් සමග සහජීවනයේ කටයුතු කළ ආකාරය.
(iv) ⋆ වෙළඳපලවල් හා වෙළඳසැල් පැවතීම.
⋆ අභ්‍යන්තර වෙළඳාමේ දී නීති රීති පනවමින් අකටයුතුකම් පාලනය.
⋆ වෙළඳ ශ්‍රේණි වශයෙන් සංවිධානාත්මක වෙළඳාම සිදු කිරීම.

07. (i) ගව්ව, යොදුන, උසබ
(ii) ⋆ කෘෂිකාර්මික කටයුතු සාර්ථක කර ගැනීමට.
⋆ ගංවතුර පාලනය කිරීම.
⋆ නාගරික ජනතාවගේ වෙනත් අවශ්‍යතා සම්පූර්ණ කිරීම.
(iii) බලංගොඩ සමනල වැව - ස්වභාවික සුළං බලය යොදා ගනිමින්.
දෙහි ඇළකන්ද ප්‍රදේශය - මයිනහම ආධාරයෙන් සුළං බලය ලබාගනී.
(iv) ⋆ වැව්බැම්ම ඉදිකිරීම පිළිබඳ.
⋆ සොරොව්ව හා බිසෝකොටුව ඇසුරෙන්
⋆ රළපනාව

08. (i) දාගැබ්, බෝධිඝර, පිළිමගෙවල් විහාරගෙවල්, ආරාම, දානශාලා
(ii) ⋆ වගාවලට වැළඳෙන කෘමි උවදුරු වළක්වා ගැනීම.
⋆ හරකුන්ට වැළඳෙන ඇතැම් රෝග නිවාරණයට
(iii) ⋆ රෝහල් ඉදි කිරීම.
⋆ වැසිකිලි කැසිකිලිවල අපද්‍රව්‍ය කළමණාකරනයට කටයුතු කිරීම.
(iv) පෙළපොතෙහි පිටු අංක 68, 69, 70

09. (i) භෝජකපති, දකපති, මතරමජබක, නෙටුකනබ අය, කැති අඩ
(ii) ⋆ කැලෑවල ගස් කොළන් නොකැපිය යුතුය. - III උදය
⋆ උස් ගොඩබිම් කළමනාකරණයේ දී රජය විසින් පනවා තිබෙන නීති රීතිවලට අනුකූලව ක්‍රියා කළ යුතුයි. - V කාශ්‍යප රජු
⋆ නිසි කලට සී සෑම නොකරන පුද්ගලයන්ට දඩ නියම කිරීම. - V කාශ්‍යප රජු
(iii) ⋆ කාන්තාවට පාලනය සම්බන්ධ වීමට අවස්ථාව ලැබීම.
⋆ මවක් වීම නිසා ගෞරවයට පාත්‍ර වීම.
⋆ එදිනෙදා කටයුතු කිරීම වෙනුවෙන් ගෞරවය පුද කිරීම ආදී.
(iv) ⋆ රජ පෙළපත් අතර බල අරගල
⋆ දුර්වල පාලකයන් බලයට පත්වීම.
⋆ ආර්ථික පරිහානිය
⋆ කාලිංග මාඝ ආක්‍රමණය